සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

තෙවන වාර පරීක්ෂණය
**மூன்றாம் தவணைப் பரீட்சை - 2026**
Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: **13** | විෂයය / பாடம் / Subject: **නර්තනය (දේශීය)** | පත්‍රය / வினாத்தாள் / Paper: **II** | පැය / மணித்தியாலம் / Hours: **3** |

**උපදෙස් :**

- මෙම ප්‍රශ්න පත්‍රය I , II හා III වශයෙන් කොටස් තුනකින් සමන්විත වේ.
- I කොටසේ 1 හා 2 ප්‍රශ්න **අනිවාර්ය** වේ.
- II, III කොටස්වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරා ගෙන අනිවාර්ය ප්‍රශ්න දෙක ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතුයි.
- සෑම ප්‍රශ්නයකම (I) කොටසට ලකුණු හයක් ද (II) කොටසට ලකුණු හයක් ද (III) කොටසට ලකුණු අටක්ද වශයෙන් මුළු ලකුණු 20ක් බැගින් හිමි වේ.

1. (I) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.

   (අ) තකු ජිං ගත් තරිකිට කුංතක

   (ආ) ගත්තම් දොම් ගත ගුගුද ගුදම් ගත

   (ඉ) ජිං ජිං තත් කරතක තත්කිට ජිමිතකු

   (II) පහත සඳහන් කවි පදය මැදුම් තනි තිතට අනුව ප්‍රස්ථාරගත කරන්න.

   රන්විල රිද්දි විල කෙලිනා බිසවුන්ට

   (III) මයුරා වන්නමේ අඩව්ව හෝ ශුද්ධතාලය සිංදු වන්නමේ ඉරට්ටිය හෝ නාග ගජගා වන්නමේ අඩව්ව හෝ ප්‍රස්ථාර කරන්න.

2. ශ්‍රී ලාංකේය නර්තන කලාවේ විකාශනය පිළිබඳ අධ්‍යයනයේ දී සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වැදගත් වේ.

   (I) අනුරාධපුර යුගයේ නර්තන කලාව පැවැති තත්ත්වය පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය දෙකක් ඇසුරෙන් විමසන්න.

   (II) ගම්පොළ යුගයේ නර්තන කලාව පිළිබඳ තොරතුරු රූකම් දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.

   (III) කෝට්ටේ යුගයේ නර්තන කලාව තුළ කාන්තා දායකත්වය සාහිත්‍ය මූලාශ්‍රය තුනක් ඇසුරින් සාකච්ඡා කරන්න.

## II කොටස

3. (I) වලියක් මංගල්‍යා ශාන්තිකර්මයේ එන සමාජ විශ්වාස තුනක් පිළිබඳ සාකච්ඡා කරන්න.

   (II) කිරිමඩු ශාන්තිකර්මයේ පුරාවෘත්ත කතාව හා බැදි නාට්‍යමය අවස්ථා දෙකක් පිරික්සන්න.

   (III) බලි ශාන්තිකර්මයේ ඇඹුම් ශිල්ප ක්‍රම සහ වර්ණ ගැන්වීම පිළිබඳ විමසීමක් කරන්න.

4. (I) අයහපත් ක්‍රියා කලාප තම ජීවිතයට ඇති කරනු ලබන බලපෑම සන්නියකුම් ශාන්තිකර්මයේ පුරාවෘත්ත කතා ඇසුරෙන් විමසන්න.

   (II) පොත්කඩේ පාළිය සහ ඌරා යක්කම නාට්‍යමය අවස්ථාවන්හි සම විෂමතා දෙක බැගින් සාකච්ඡා කරන්න.

   (III) චරිත නිරූපණ කාර්ය සාර්ථක කරගැනීම සඳහා භාවිත කර ඇති විවිධ උපක්‍රම හතරක් රටයකුමේ නානුමුරය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

5. (I) සිංහල හා ද්‍රවිඩ ජනයාගේ ජීවන රටාව ගැමි නැටුම් තුළින් නිරූපණය කෙරේ. කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

   (II) සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම්වල සමාන අසමානතා සාධක හතරක් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

   (III) සිංහල ගැමි නැටුම්හි අතීත හා වර්තමාන තත්ත්වය සාධක හතරක් උදාහරණයට ගෙන විමසුමට ලක් කරන්න.

## III කොටස

6. පහත සඳහන් වගුවෙහි (අ), (ආ), සහ (ඉ) යන කොටස්වලට අදාළව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| මෘදංගය | පටාචාරා | II වන හෙන්රි රජු |
| පඛාවාජ් | නිදිකුමරිය | 14 වන ලුවී රජු |
| තබ්ලාව | කල්පනා | මහා පීටර් රජු |
| කෝල් | ශාප්මෝචන් | මහා අක්බර් රජු |

(I) (අ) කථක් නර්තන සම්ප්‍රදායේ අද්‍යතනයේ භාවිත වාද්‍ය භාණ්ඩයක් නම් කොට ඒ පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(II) (ආ) දේශීය මුද්‍රා නාට්‍ය තෝරා එහි චරිත නිරූපණ අවස්ථා තීව්‍ර කිරීම සඳහා පසුතල සැලසුම්කරන යොදාගෙන ඇති ආකාරය විමසුමට ලක් කරන්න.

(III) (ඉ) බැලේ රංග කලාව ඉතාලියේ සිට ප්‍රංශය දක්වා ව්‍යාප්ත වීමේදී ඒ සඳහා මූලික වූ රජු නම් කර එතැන් සිට එම රංග කලාව එහි ව්‍යාප්ත වූ ආකාරය පිළිබඳ තොරතුරු සාකච්ඡා කරන්න.

7. (I) පෙරදිග හා අපරදිග රටවල විවිධ ආභාසයන් දේශීය නර්තන කලාව කෙරෙහි බලපෑ ආකාරය නිදසුන් තුනක් ඇසුරෙන් විමසීමක් කරන්න.

(II) රූපවාහිනි නර්තන කලා කෘති ප්‍රේක්ෂක රසවින්දනය උදෙසා සකස් කිරීමේදී ගෙන ඇති තාක්ෂණික උපක්‍රම තුනක් පිළිබඳ සාකච්ඡා කරන්න.

(III) දේශීය නර්තන සම්ප්‍රදායවල අනන්‍යතා ලක්ෂණ හතරක් සහ ඒවා කෙබඳු ආකාරයෙන් සුරක්ෂිත කළ යුතු ද යන්න කරුණු හතරක් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

8. (I) නූතන වේදිකාවක දක්නට ලැබෙන නව ප්‍රවණතා 3ක් පිළිබඳ සාකච්ඡා කරන්න.

(II) නර්තන රචනය හා චිත්‍ර සංචරණය අතර ඇති සමාන රූපී ලක්ෂණ දෙකක් විස්තර කරන්න.

(III) නර්තන අංගයක ප්‍රාසාංගික බව ඉස්මතු කිරීමෙහිලා විදුලි ආලෝකය වැදගත් වන ආකාරය නිදසුන් තුනක් ඇසුරෙන් පහදන්න.